# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 5 දරන සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 පෙබරවාරි මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 පෙබරවාරි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 6.75 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 5 දරන සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 පෙබරවාරි මස 09 වන දින]

එල්. ඩී.—ඕ (අයි.එන්.සී.).22/2004.

## සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම්කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1**. මේ පනත 2007 අංක 5 දරන සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සංස්ථාගත කිරීම.

**2**. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු සමස්ථ ලංකා ජාත්‍යන්තර සංවර්ධන සංගමය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇති අතර, ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී ලංකාවේ සමාජයීය සහ ආර්ථික සංවර්ධනය සඳහා දිරිගැන්වීම ;

(ආ) නාගරික, ග්‍රාමීය ප්‍රදේශවල සහ වතු වැවිලි අංශයේ කෘෂිකර්මය, සත්ව පාලනය සහ ධීවර කටයුතු සංවර්ධනය කිරීම අරභයා වූ ව්‍යාපෘති ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) තරුණයන්ට ස්වයං රැකියාවක නිරතවීමට හැකිවනු පිණිස වැවිලි අංශයේ කුඩා කෘෂිකර්මාන්තවල පුහුණුව ලබා දීම ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ සම්මේලන, දේශන, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීමෙන් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ශිෂ්‍යත්ව, අධිශිෂ්‍යත්ව, මුල්‍යාධාර, ත්‍යාග සහ වෙනත් සම්මාන ප්‍රදානය කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා නිරතව සිටින තැනැත්තන්ට ඉඳුම්හිටුම්, ආහාරපාන සහ අනෙකුත් පහසුකම් සැපයීම;

(උ) මාර්ග සංවර්ධන සහ ඉදිකිරීම් කටයුතු භාර ගැනීම සහ යම් ගොඩනැගිල්ලක් සහ යන්ත්‍රෝපකරණ වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම සහ වෙනත් සේවා සැපයීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු, කණ්ඩායම් වශයෙන් කෙරෙන අධ්‍යයන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පැවැත්වීම ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ පරිපූර්ණ කරගැනීම සඳහා යෝග්‍ය යයි සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, පළ කිරීම සහ බෙදා හැරීම.

**4**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ආ) විනිමය බිල්පත්‍ර, බිල්පත්‍ර, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ ගනුදෙනු කළ හැකි වෙනත් සාධන පත්‍ර ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ දී හෝ ඉන් පිටත දී හෝ යම් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සාක්ෂාත් කර ගැනීමට කෙළින්ම හෝ වක්‍රාකාරයකින් හෝ හිතකර වන නීත්‍යනුකූල භාර භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා සේවක පිරිස් සංස්ථාවේ වියදමින් ශ්‍රී ලංකාවේ දී හෝ විදේශවල දී පුහුණු කිරීම ;

(ඊ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි, සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ ඔවුන්ට වැටුප්, දීමනා, විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ගෙවීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ මුදල්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත්වල හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ආයෝජනවල ආයෝජනය කිරීම.

**5**. (1) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වන, (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් විසින්, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරුවා වූ සංගමයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ යම් මහා සභා රැස්වීමක දී හෝ ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කළ සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් පන්තියේ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු සාමාජික ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කොට ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් නෙරපීම ;

(ආ) සභාව තෝරා පත් කිරීම, නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් පහකිරීම සහ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවත්වා ගෙන යාම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිළධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව ;

(ඈ) සභාවේ සහ එහි යම් අනුකමිටුවක රැස්වීම් සම්බන්ධයෙන්, ඒ රැස්වීම් කැඳවීමේ දී සහ පැවත්වීමේ දී ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ඒ රැස්වීම්වල ගණපූර්ණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති, එම උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම, එවැනිම රැස්වීමක දී, කලින්කල වෙනස් කරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ අරමුදල.

**7**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. තෑගි, තෙස්තමේන්තු නියාදන, මාරුකිරීම්, පරිත්‍යාග හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් සහ කවර වුව ද දේපළක්, සභාව විසින් තීරණය කරනු ලබන පරිදි, සංස්ථාවේ නමින්, බැංකු එකක හෝ ඊට වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා ක්ෂයවීමේ අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලුම වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දරනු ලැබිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, දායක මුදලක්, තෑග්ගක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්නුතාව ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට පූර්ණ බලය සහිතව, තත් කාලයේ සංස්ථාවේ බලපවත්නා නීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

9. සංස්ථාවේ කිසිම සාමාජිකයෙක්, ඔහුගෙන් සංස්ථාවට වාර්ෂිකව අය විය යුතු සාමාජික ගාස්තු ඉක්මවන කිසිදු දායක මුදලක්, සංස්ථාවේ ණය සහ බැරකම් බේරුම් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ, ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.

10. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවැති සංගමයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය, ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

11. සංස්ථාව ගණන් බේරා වසා දමනු ලැබූ විට හෝ විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් බේරුම් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ ලාභයක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් කටයුතු.

**12**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු, වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තීයේ යෙදීම සඳහා නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13**. සංස්ථාවේ මුද්‍රාව, සභාපතිවරයා හෝ කළමනාකාර අධ්‍යක්ෂ හෝ සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරියේ දී මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.